9. **ශීර්ෂය 9 - පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය**

---

**9.1 විගණන විෂය පථය**

---

පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරයේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2014 ජූලි 30 දින දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙත නිකුත් කරන ලදි. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාල වේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**9.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

---

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148,149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

9.3 **විගණන නිරීක්ෂණය**

-----------------------

2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය වාර්තා හා පොත් අනුව පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරයේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශ මෙහි 9.4 සිට 9.7 දක්වා ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයාගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

9.4 **යහ පාලනය හා ගිණුම් කටයුතුභාවය.**

----------------------------------------

**9.4.1** **වාර්ෂික ක්‍රියාකාරි සැලැස්ම**

------------------------------

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්, පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්, දෙපාර්තමේන්තු ප්‍රධානීන්, දිස්ත්‍රික් ලේකම්වරුන් හා පළාත් පාලන ආයතන ප්‍රධානීන් අමතන ලද 2010 මාර්තු 10 දිනැති අංක පීඑෆ්/ආර්/2/2/3/5(4) දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලිපිය ප්‍රකාරව 2010 සහ ඉන් ඉදිරියට දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික ක්‍රියාකාරි සැලැස්මක් පිළියෙල කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ක්‍රියාකාරි සැලැස්ම 2013 දෙසැම්බර් 31 දින වන විටත් පිළියෙල කර නොතිබුණි.

**9.4.2** **වාර්ෂික කාර්යසාධන වාර්තා**

-----------------------------------

2002 සැප්තැම්බර් 12 දිනැති අංක 402 හා 2004 පෙබරවාරි 20 දිනැති අංක 402(1) දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛ ප්‍රකාර අධිකාරය විසින් පිළියෙල කළ යුතු වාර්ෂික කාර්යසාධන වාර්තාව මුදල් වර්ෂය අවසන් වී දින 150 ක් ඇතුළත විගණකාධිපතිට පිටපතක් සහිතව පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂයට අදාල කාර්යසාධන වාර්තාව 2014 ජූනි 10 දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

## 9.5 අනුකූල නොවීම්

-------------------------

**නීති,රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

-----------------------------------------------------------------

නියැදි විගණන පරීක්ෂණ වලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා විග්‍රහ කර පහත දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසි වලට යොමුව | | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය** | |
| | II පරිච්ඡේදයේ 2.1 වගන්තිය | රාජ්‍ය සේවයේ සෑම තනතුරක් සඳහාම තනතුරෙහි වැටුප් පරිමාණය, අවශ්‍ය සුදුසුකම්, වයස් සීමාව ආදී අනෙකුත් විස්තර නිශ්චිතව ඇතුළත්කර බඳවාගැනීමේ පටිපාටියක් අනුමත කරවා ගතයුතු වුවත් අධිකාරය විසින් එකී විධිවිධාන ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| (ආ) | රාජ්‍ය මුදල් චක්‍රලේඛ | |
| | 2009 සැප්තැම්බර් 18 දිනැති අංක පීඑෆ්/437 දරන චක්‍රලේඛය | රාජ්‍ය ආයතනවල මෝටර් රථ රක්ෂණාවරණය ජාතික රක්ෂණ භාර අරමුදල වෙතින් හෝ සීමාසහිත ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවෙන් ලබා ගත යුතු වුවත්, අධිකාරය සතු වාහනයක් එකී චක්‍රලේඛයට පටහැනිව වෙනත් රක්ෂණ සමාගමකින් රක්ෂණය කර සමාලෝචිත වර්ෂයේදී ඒ සඳහා රු.112,899 ක රක්ෂණ වාරිකයක් ගෙවා තිබුණි. |

## 9.6 කාර්යසාධනය

-------------------------

2002 අංක 4 දරන පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය පනතේ 7 වගන්තිය ප්‍රකාරව විනිශ්චය අධිකාරය වෙත යම් අභියාචනයක් ලැබුණු දින සිට මාස 02 ක කාලසීමාවක් ඇතුළත විභාගකොට අවසාන වශයෙන් සුදුස්සක් කළ යුතු බව දක්වා තිබුණි. 2013 දෙසැම්බර් 31 දින වන විට අධිකාරයට අභියාචනා 423 ක් විසඳීම සඳහා පැවති අතර සමාලෝචිත වර්ෂය තුළදී පැමිණිලි 90 ක් පමණක් විභාග කොට අවසන් කර තිබුණි.

## 9.7 මානව සම්පත් කළමනාකරණය

2013 දෙසැම්බර් 31 දිනට වු සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක විස්තරය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 05 | 04 | 01 |
| (ii) | ද්විතියික මට්ටම | 12 | 09 | 03 |
| (iii) | ප්‍රාථමික මට්ටම | 04 | 04 | - |
| | **එකතුව** | **21** | **17** | **04** |

සමාලෝචිත වර්ෂය අවසානය වන විට පුරප්පාඩු 04 ක් පිරවීමට අධිකාරය කටයුතු කර නොතිබුණි.